ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා
ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

# ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

ඊමේල් : info@cida.gov.lk          වෙබ් අඩවිය : www.cida.gov.lk

# පුරප්පාඩු

## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) පහත සඳහන් තනතුරු වලට අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) (HM 1-3) (තනතුරු 01)

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සමඟ

මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ රාජ්‍ය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ''කළමනාකරණ මට්ටමේ'', තනතුරක අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරු සේවා කාණ්ඩයේ (MM) I වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහකට (05) නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

- **වැටුප් පරිමාණය :**

  HM 1-3    රු. 86,865/ - 15 x 2,270/- 120,915/-

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

  **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

  සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කළ ලකුණු පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ▪ අදාළ අමතර පළපුරුද්ද | - | ලකුණු 30 |
| ▪ අදාළ අමතර අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| ▪ වෙනත් ජයග්‍රහණ | - | ලකුණු 15 |
| ▪ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | - | ලකුණු 25 |
| | | ලකුණු 100 |

පත්වීම් හුදෙක්ම ලබා දෙනුයේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා අනුපිළිවෙළ අනුව ය.

- **වයස :**

  **ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩය (HM 1-3)**

  වයස අවුරුදු 35 ට නො අඩු සහ 55 ට නොවැඩි විය යුතු ය.

  අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ රාජ්‍ය/ සංස්ථා අංශයේ අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 02. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) (MM 1-1) II ශ්‍රේණිය - තනතුරු 01
## 03. සහකාර අධ්‍යක්ෂ (ගෙවීම්) (MM 1- 1) II ශ්‍රේණිය - තනතුරු 01

**සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය/ ගිණුම්කරණය/ වාණිජ්‍යය/ ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර් මධ්‍ය විභාගය හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) / සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) I හා II කාණ්ඩයේ විභාග සමත්වී තිබීම.

සමඟ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ අවම වශයෙන් වසර 01 ක විධායක මට්ටමේ තනතුරක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**සටහන : පරිගණක ගත ගිණුම්කරණ කටයුතු පිළිබඳ හැකියාව අමතර සුදුසුකමක් සේ සැළකේ.**

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකරු සේවා කාණ්ඩයේ (JM) ගිණුම් නිලධාරී /විගණන නිලධාරී තනතුරේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

- **වැටුප් පරිමාණය :**

  MM I -1    රු. 53,175/- 10 x 1,375/- 15 x 1,910/- 95,575 /-

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

  ලිඛිත පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

- **වයස :**

  කළමනාකරණ මට්ටම - (M M I-I) II ශ්‍රේණිය

  අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

  අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ රාජ්‍ය/ සංස්ථා අංශයේ අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

---

- **පත්වීමේ ස්වභාවය :**

  සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) සඳහා හිමිකම් ඇති ස්ථිර පත්වීමකි.

**සෑම අයදුම්කරුවෙකුම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් හා ජවයකින් යුක්ත විය යුතු ය.

**වෙනත් ප්‍රතිලාභ**

- රජයේ අනුමත දීමනා.
- CIDA විසින් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) වෙත වැටුපෙන් 15% හා 3% ක් දායක දායක කරනු ඇති අතර සේවකයා විසින් වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත.
- ප්‍රසාද දීමනා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව ලබා දෙනු ඇත.
- වෛද්‍ය රක්ෂණාවරණ පහසුකම්.
- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛනවලට අනුව ප්‍රවාහන පහසුකම්/ දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය සිදු කෙරෙනු ඇත.

අධ්‍යාපන, වෘත්තීය සහ පළපුරුද්දට අදාළ සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් හා විද්‍යුත් තැපෑලෙන් යන ක්‍රම දෙකෙන්ම **13.07.2021** දිනට හෝ ඊට පෙර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති වෙත එවිය යුතු ය. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සේවකයන්/ ආයතනයේ ස්ථිර සේවකයන් තම අයදුම්පත්‍ර අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු අතර තෝරාගනු ලැබුවහොත් අදාළ තනතුරින් මුදා හැරිය හැකි බව දැක්විය යුතු ය. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ දැක්විය යුතුය.

අනෙකුත් සියලු තොරතුරු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියේ ඇත. **www.cida.gov.lk**

**නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද/ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙටි ලැයිස්තුගත කරන ලද සුදුසුකම්ලත් අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.**

**සභාපති**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**"සව්සිරිපාය" 123, විජේරාම මාවත,**
**කොළඹ 07**
**විද්‍යුත් තැපෑල - සභාපති (CIDA) - ch@cida.gov.lk**